# විශ්වවිද්‍යාල සිසුන් අර්ධකාලීන රැකියාවල නිරත වීම ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යනයක්

*ඩබ්ලිව්.එස්. ඩිලුක්ෂි [1], එච්.ඩී.පී. ප්‍රේමරත්න [2]*

වැඩ ලෝකයේ රැකියා වර්ග පූර්ණ කාලීන හා අර්ධ කාලීන වශයෙන් ද්විත්වයක් වන අතර එයින් අර්ධකාලීන වැඩ යනු සේවකයෙකු සාමාන්‍යයෙන් සතියකට පැය 30කට වඩා අඩු කාලයක් සේවය කරන රැකියාවකි. තරඟකාරී අධ්‍යාපන රටාව සමඟ ඇති වන මූල්‍ය අවශ්‍යතා මත අස්ථිර වැඩ කොන්දේසි, ගෙවීම්, වගකීම් හා අවම වෘත්තීය ප්‍රගතිය ආදී ලක්ෂණ සහිත අර්ධ කාලීන රැකියා සිදු කිරීමට විශ්වවිද්‍යාල සිසුන් පෙළඹී ඇත. මේ නිසා සිසුන්ගේ අධ්‍යාපන කාර්යසාධනයට එනම් ඉහළ ප්‍රතිඵල ළඟා කර ගැනීම සීමා වී ඇති බව පූර්ව නිගමන වේ. ලංකාව තුළ මේ සම්බන්ධයෙන් බොහෝ පර්යේෂණ මගින් අවධානයට ලක් කර ඇති නමුත් එම පර්යේෂණ ලංකාවේ ආර්ථික අර්බුධයට පෙර කාලයට සීමා වී ඇත. ඒ අනුව පර්යේෂණ හිඩැස සලකා බලමින් ආර්ථික අර්බුදය සමඟ විශ්වවිද්‍යාලයෙන් පිටත පමණක් නොව විශ්වවිද්‍යාලය තුළ සිසුන් සඳහා අර්ධ කාලීන රැකියාවල නිරත වීමේ අවස්ථා වර්ධනය කර ඇති සමයක සිසුන්ගේ අධ්‍යාපන කාර්යසාධනයට අර්ධ කාලීන රැකියාව කුමන ආකාරයක බලපෑමක් ඇති කරනවාද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. මෙහිදී ඉලක්කගත නියැදීමේ ක්‍රමය හරහා තෝරා ගත් 120ක නියැදියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ නමය නියෝජනය කරමින් සම්බන්ධ කරගත් අතර මිශ්‍ර පර්යේෂණ ක්‍රමය යටතේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. එහිදී මාර්ගගත ආකාරයට ප්‍රශ්නාවලි හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කර ගැනීම සිදු වූ අතර විස්තරාත්මක, සහසම්බන්ධතා හා තේමාකරණය වැනි විශ්ලේෂණ ක්‍රම මගින් විශ්ලේෂණය කිරීම සිදු විය. නියැදියට අනුව අධ්‍යාපන කාර්යසාධනයට බලපාන සාධක අතර සහසම්බන්ධතාවය අධ්‍යයනයේ දී වැඩ කරන කාලය, වැඩ ආතතිය, වැඩ ප්‍රමාණය වැනි සාධක මත සිසුන්ගේ අධ්‍යාපනයට ඍණාත්මක බලපෑම් ඇති කර ඇත. නමුත් අර්ධ කාලීන රැකියා මගින් වෘත්තීය කුසලතා වැඩි දියුණු කර ගැනීම, කාල කළමනාකරණය හුරු වීම වැනි ධනාත්මක තත්ත්වයන් නිර්මාණය වී ඇත. මේ හේතුවෙන් නිගමනය කළ හැක්කේ අර්ධ කාලීන රැකියාව සිසුන්ගේ අධ්‍යයන කටයුතු කෙරෙහි ප්‍රබල ආකාරයක බලපෑමක් ඇති නොකරන බවයි. පවතින ආර්ථික පීඩාකාරී තත්ත්වය මත සිසුන් අර්ධ කාලීන රැකියාවේ අවශ්‍යතාවය අවධාරණය කරන නමුත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පූර්ණ කාලීන අධ්‍යාපනය අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් සිසුන්ට අධ්‍යාපනය හා රැකියාව අතර සමබරතාවයක් පවත්වා ගැනීමට හැකි ආකාරයේ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට යෝජනා කළ හැකිය.

**ප්‍රමුඛ පද** : අර්ධ කාලීන රැකියා, අධ්‍යයන කාර්ය සාධනය, විශ්වවිද්‍යාල, සිසුන්, බලපෑම

1 සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. shanikadilukshi05@gmail.com

2 සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. pri.hapuarachchi@arts.pdn.ac.lk